# LEARNING RECOVERY PLAN

**විෂය** Subject - පෙරදිග සංගීතය

**ශ්‍රේණිය** Grade - 10

**කාලච්ඡේද** Periods - 60

| | **නිපුණතාවය** Competency | **ක්‍රියාකරකම** Activity | **අත්‍යවශ්‍ය ඉගෙනුම් පල** Essential Learning Outcomes | **විෂය අන්තර්ගතය** Subject Content | **කාලච්ඡේද** Periods |
|---|---|---|---|---|---|
| **9 ශ්‍රේණියෙන්** | නිපුණතාව 6.0 | ක්‍රියාකාරකම 17 | • නූර්ති ගීතය අයත් නාට්‍ය නම් කරයි.<br>• නූර්ති ගීතවල තනු ආකර්ෂණීය බව පිළිගනියි.<br>• නූර්ති ගීතයක් ගායනය/වාදනය කරයි. | නූර්ති ගීත ගායනය/වාදනය කරයි | 02 |
| | නිපුණතාව 1.0 | ක්‍රියාකාරකම 18 | • භූපාලි රාගයට අයත් ස්වර නම් කරයි.<br>• ස්වර 05ක් යෙදුණ ද භූපාලි මිහිරි රාගයක් බවට පිළිගනියි.<br>• ස්වර සංගති හඳුනා ගනිමින් භූපාලි රාගයේ ස්වර අභ්‍යාස නිවැරදි ව ගායනය/වාදනය කරයි. | භූපාලි රාගයේ ස්වර අභ්‍යාස | 01 |
| | නිපුණතාව 1.0 | ක්‍රියාකාරකම 19 | • සර්ගම් ගීත ස්වර පමණක් ඇතුළත් ගීත බව ප්‍රකාශ කරයි.<br>• සර්ගම් ගීතය නිවැරදි ව ගායනය/වාදනය කරයි.<br>• සර්ගම් ගීතය පුහුණු වීමෙන් රාගය අධ්‍යයනය කිරීමට පහසු බව දැන ප්‍රකාශ කරයි. | භූපාලි රාගයේ සර්ගම් | 01 |
| | නිපුණතාව 1.0 | ක්‍රියාකාරකම 20 | • භූපාලි රාගය ස්වර 05කින් යුත් රාගයක් බව හඳුනා ගනියි.<br>• රසවත් බවින් අනූන රාගයක් බව පුහුණුවීම් මඟින් හඳුනා ගනියි.<br>• මධ්‍ය ලය ගීතය නිවැරදි ව ගායනය, වාදනය කරයි. | භූපාලි රාගයේ මධ්‍යලය ගීතය | 03 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | නිපුණතාව 1.0 | ක්‍රියාකාරකම 22 | • ලක්ෂණ ගී පිළිබඳ ව දැන ගනියි.<br>• ලක්ෂණ ගීත ගායනය කරයි.<br>• රාග විස්තර ඉගෙන ගත හැකි සරල හා වින්දනාත්මක මාර්ගය ලක්ෂණ ගී බව අවබෝධ කොට ගෙන පවසයි. | භූපාලි රාගයට අයත් ලක්ෂණ ගී ගායනය කරමින් රාග ලක්ෂණ විමසීම | 01 |
| | නිපුණතාව 7.0 | ක්‍රියාකාරකම 26 | • අපරදිග සංගීත භාණ්ඩ නම් කරයි.<br>• ඒවා වර්ග කරයි.<br>• බටහිර සංගීත භාණ්ඩ රාශියක් ඇති බව පිළිගනියි.<br>• භාණ්ඩ වෙන් කිරීමේ කුසලතාව ලබයි. | අපරදිග සංගීත භාණ්ඩ වර්ගීකරණය | 01 |
| | නිපුණතාව 8.0 | ක්‍රියාකාරකම 28 | • බටහිර සංගීත ප්‍රස්තාරයක භාවිත වන සංකේත කිහිපයක් පැහැදිලි කරයි.<br>• එම සංකේත ලියා දක්වයි.<br>• බටහිර ක්‍රමයට ප්‍රස්තාර කිරීමේ අවශ්‍යතාව පිළිගනියි.<br>• බටහිර ක්‍රමයට ප්‍රස්තාර කිරීමේ කුසලතාව ලබයි. | Sharps, Flat, Natural Marks | 01 |
| | නිපුණතාව 8.0 | ක්‍රියාකාරකම 29 | • බටහිර සංගීත ප්‍රස්තාරයක භාවිත වන සංකේත කිහිපයක් පැහැදිලි කරයි.<br>• එම සංකේත ලියා දක්වයි.<br>• බටහිර ක්‍රමයට ප්‍රස්තාර කිරීමේ සංකේත රාශියක් ඇති බව පිළිගනියි.<br>• බටහිර ක්‍රමයට ප්‍රස්තාර කිරීමේ කුසලතාව ලබයි. | Clef, Rest Mark, Tie | 01 |
| | නිපුණතාව 8.0 | ක්‍රියාකාරකම 30 | • ''ස්කේල'' යන්න පැහැදිලි කරයි.<br>• C, G, F, B$^b$ Major & Minor Scale 'ස්කේලවලට' අයත් ස්වර නම් කරයි.<br>• බටහිර ක්‍රමයට 'ස්කේල' රාශියක් ඇති බව පිළිගනියි.<br>• 'ස්කේල' බටහිර ක්‍රමයට ප්‍රස්තාර කිරීමේ කුසලතාව ලබයි. | C,G,F, B$^b$ Scale | 02 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | නිපුණතාව 8.0 | ක්‍රියාකාරකම 31 | • Key Signature යන්න පැහැදිලි කරයි.<br>• එක් එක් ස්කේලයන් හැඟවීමට Key Signature භාවිත කරන බව දැන ගනියි.<br>• එක ම ගීතයක් විවිධ ස්වර ශ්‍රැති කරගනිමින් ඉදිරිපත් කළ හැකි බව පිළිගනියි.<br>• බටහිර ප්‍රස්තාරයක Key Signature ලකුණු කිරීමේ කුසලතාව ලබයි. | Key Signature | 01 |
| | නිපුණතාව 8.0 | ක්‍රියාකාරකම 32 | • Time Signature යන්න පැහැදිලි කරයි.<br>• දාදරා, කෙහෙර්වා, බෙම්ටෝ යන තාලවලට අදාළ බටහිර තාල නම් කරයි.<br>• බටහිර ක්‍රමයට ද තාල රාශියක් ඇති බව පිළිගනියි.<br>• බටහිර ප්‍රස්තාරයක Time Signature ලකුණු කිරීමේ කුසලතාව ලබයි. | Time Signature | 01 |
| | නිපුණතාව 1.0 | ක්‍රියාකාරකම 37 | • සර්ගම් ගීතය අධ්‍යයනය කරයි.<br>• සර්ගම් ගීතය නිවැරදි ව ගායනය/වාදනය කරයි.<br>• සර්ගම් ගීතය මඟින් රාගයේ ස්වර වින්දනාත්මක ව හුරුවිය හැකි බව අවබෝධ කොටගෙන ප්‍රකාශ කරයි. | කාෆි රාගයේ සර්ගම් | 01 |
| | නිපුණතාව 1.0 | ක්‍රියාකාරකම 38 | • කාෆි රාගය ගන්ධාරය හා නිෂාදය කෝමලව යෙදෙන සම්පූර්ණ ජාති රාගයක් බව වටහා ගනියි.<br>• කාෆි රාගයේ මධ්‍ය ලය ගීත ගැයීමට කැමැත්ත ප්‍රකාශ කරයි.<br>• මධ්‍ය ලය ගීතය නිවැරදි ව ගායනය කරයි. | කාෆි රාගයේ මධ්‍යලය ගීතය | 03 |
| | නිපුණතාව 1.0 | ක්‍රියාකාරකම 40 | • ලක්ෂණ ගී පිළිබඳ ව දැන ගනියි.<br>• ලක්ෂණ ගීත ගායනය කරයි.<br>• රාග විස්තර ඉගෙන ගත හැකි සරල හා වින්දනාත්මක මාර්ගය ලක්ෂණ ගී බව අවබෝධ කොට ගෙන පවසයි. | කාෆි රාගයට අයත් ලක්ෂණ ගී ගායනය කරමින් රාග ලක්ෂණ විමසීම | 01 |
| | නිපුණතාව 3.0 | ක්‍රියාකාරකම 43 | • උකුසා වන්නමේ විශේෂ ලක්ෂණ හඳුනා ගනිමින් විස්තර කරයි.<br>• විශේෂ අවස්ථාවන්හි දී ප්‍රසංගාත්මක ව නර්තනය සමඟ ගායනය කිරීමට කැමැත්ත පළ කරයි.<br>• උකුසා වන්නම ගායනය කරයි. | උකුසා වන්නම ගායනය | 01 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | නිපුණතාව 3.0 | ක්‍රියාකාරකම 44 | • ප්‍රශස්ති වල හා හටන් ගීවල විශේෂ ලක්ෂණ වෙන් වෙන්ව විස්තර කරයි.<br>• ප්‍රශස්ති හා හටන් ගී ගායනය කිරීමට යෝජනා කරයි.<br>• ප්‍රශස්ති හා හටන් ගී ගායනය කරයි. | ප්‍රශස්ති සහ හටන් ගී ගායනය | 02 |
| | නිපුණතාව 9.0 | ක්‍රියාකාරකම 47 | • සංගීත ප්‍රසංගයක දී යොදා ගන්නා අත්‍යවශ්‍ය තාක්ෂණික මෙවලම් කිහිපයක් පිළිබඳ විස්තර කරයි.<br>• තාක්ෂණික මෙවලම් ක්‍රියාකාරිත්වය පැහැදිලි කරයි.<br>• පාසලේ පවත්වන සංගීත ප්‍රසංගයක ගුණාත්මක බව රඳවා ගැනීමට තාක්ෂණික උපකරණ බලපාන බව පිළිගනියි.<br>• තාක්ෂණික මෙවලම් පිළිබඳ නිවැරදි භාවිත හුරුව ලබයි. | මයික්‍රෆෝනය ඇම්ප්ලිෆයරය, බෆල් මික්සර් | 01 |
| | **කාලච්ඡේද එකතුව** | | | | **24** |

| | **නිපුණතාවය**<br>Competency | **ක්‍රියාකරකම**<br>Activity | **අත්‍යවශ්‍ය ඉගෙනුම් පල**<br>Essential Learning Outcomes | **විෂය අන්තර්ගතය**<br>Subject Content | **කාලච්ඡේද**<br>Periods |
|---|---|---|---|---|---|
| **10 ශ්‍රේණිය** | නිපුණතාව 1.0 | ක්‍රියාකාරකම 1 | • ස්වර අභ්‍යාස නිවැරදි ව ගායනය කරමින් ස්වර ඥානය වර්ධනය කරගනියි.<br>• රාගධාරී සංගීතයේ ස්වර අභ්‍යාස ගායනය වැදගත් වන බව පිළිගනියි.<br>• විවිධ රටාවන්ට අනුව භෛරවී රාගයෙන් ස්වර අභ්‍යාස ගොඩ නැගීමේ හැකියාව ප්‍රදර්ශනය කරයි. | භෛරවී ස්වර අභ්‍යාස | 01 |
| | නිපුණතාව 1.0 | ක්‍රියාකාරකම 2 | • ස්වර ප්‍රස්තාර ගායනය කිරීමේ හැකියාව ලබයි.<br>• සර්ගම් මතකයෙන් ගායනය කරයි.<br>• සර්ගම් ගීතයේ ලක්ෂණ පිළිබඳ අදහස් ප්‍රකාශ කරයි.<br>• රාගධාරී සංගීතයේ සර්ගම් වැදගත් වන බව පිළිගනියි. | භෛරවී රාගය- සර්ගම් | 01 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | නිපුණතාව 1.0 | ක්‍රියාකාරකම 3 | • ලක්ෂණ ගීත නිර්වචනය කරයි.<br>• ලක්ෂණ ගීත පුහුණු වීමේ ඇති අගය පිළිගනියි.<br>• ලක්ෂණ ගීත නිවැරදි ව ගායනය කරයි.<br>• ලක්ෂණ ගීත ප්‍රස්තාරය ඇසුරෙන් එහි ඇතුළත් රාග විස්තර උපුටා දක්වයි.<br>• රාගාධාරී සංගීතය ප්‍රගුණ කිරීමේ දී ලක්ෂණ ගීතවල ඇති වැදගත්කම සාකච්ඡා කරයි. | භෛරවී ලක්ෂණ ගී | 01 |
| | නිපුණතාව 1.0 | ක්‍රියාකාරකම 4 | • භෛරවී රාගාශ්‍රිත නාදමාලා හඳුනා ගනියි.<br>• භෛරවී රාගය සර්ව කෝමල රාගයක් බව ප්‍රකාශ කරයි.<br>• භෛරවී මධ්‍යලය ගීත නිවැරදි ව ගායනය කිරීමේ කුසලතාවය ලබයි.<br>• රාග රස උද්දීපනය වන සේ භාවාත්මක ව ගායනා කරයි.<br>• භෛරවී රාගය ආශ්‍රිත තනු නිර්මාණයට පෙළඹෙයි.<br>• භෛරවී රාගය ආශ්‍රිත සරල ගී රස වින්දනයට යොමු වෙයි. | භෛරවී රාගයේ මධ්‍යලය ගී | 03 |
| | නිපුණතාව 1.0 | ක්‍රියාකාරකම 5 | • ස්වර අභ්‍යාසයේ ක්‍රමික අනුපිළිවෙල නිවැරදි ව ගායනය කරයි.<br>• ස්වර අභ්‍යාස ගායනය වැදගත් වන බව පිළිගනියි.<br>• වෙනත් නිර්මාණ සඳහා අත්දැකීම් පුළුල් කර ගනියි. | යමන් රාගය ස්වර අභ්‍යාස | 01 |
| | නිපුණතාව 1.0 | ක්‍රියාකාරකම 6 | • තීව්‍ර මධ්‍යමය ඇතුළත් ස්වර ප්‍රස්තාර ගායනය කිරීමේ හැකියාව ලබයි.<br>• සර්ගම් ගීතයේ ලක්ෂණ පිළිබඳ අදහස් ප්‍රකාශ කරයි.<br>• රාගධාරී සංගීතයේ සර්ගම් වැදගත් හා අත්‍යවශ්‍ය වන බව පිළිගනියි.<br>• වෙනත් නිර්මාණ සඳහා අත්දැකීම් පුළුල් කර ගනියි. | යමන් රාගය - සර්ගම් | 01 |
| | නිපුණතාව 1.0 | ක්‍රියාකාරකම 7 | • ලක්ෂණ ගීත නිර්වචනය කරයි.<br>• ලක්ෂණ ගීත පුහුණු වීමේ ඇති අගය පිළිගනියි.<br>• ලක්ෂණ ගීත ප්‍රස්තාරය ඇසුරෙන් එහි ඇතුළත් රාග විස්තර ලියයි. | යමන් රාගය ලක්ෂණ ගී | 01 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | නිපුණතාව 1.0 | ක්‍රියාකාරකම 8 | • යමන් රාගයේ යෙදෙන සුවිශේෂ ස්වර හා අංග හඳුනා ගනියි.<br>• යමන් මධ්‍යලය ගීත නිවැරදි ව ගායනය කිරීමේ කුසලතාවය ලබයි.<br>• රාග රස උද්දීපනය වන සේ භාවාත්මක ව ගායනා කරයි.<br>• යමන් රාගය ආශ්‍රිත තනු නිර්මාණයට පෙළඹෙයි.<br>• යමන් රාගය ආශ්‍රිත සරල ගී හඳුනා ගනියි. | යමන් රාගය මධ්‍යලය ගී | 03 |
| | නිපුණතාව 1.0 | ක්‍රියාකාරකම 9 | • රාග විස්තර හා බැඳි සංකල්ප නිර්වචනය කරයි.<br>• රාග විස්තර පිළිබඳ දැනුවත් වීමේ අවශ්‍යතාවය පිළිගනියි.<br>• එක් එක් පාරිභාෂික පදවලට අදාළ ව උදාහරණ ඉදිරිපත් කරයි.<br>• ප්‍රායෝගික ව භාවිතා කිරීමේ හැකියාව ලබයි.<br>• භෛරවී / යමන් ලක්ෂණ ගීත තුළින් මෙම කරුණු වෙන්කර ගැනීමට හැකියාව ලබයි. | භෛරවී / යමන් රාග විස්තර | 01 |
| | නිපුණතාව 1.0 | ක්‍රියාකාරකම 10 | • ප්‍රස්තාර කියවීමට අවශ්‍ය සංකේත හඳුනා ගෙන භාවිත කරයි.<br>• ස්වර ප්‍රස්තාර තාලානුකූල ව කියවයි.<br>• වෘත්තීය වාදකයකු වීමට අවශ්‍ය කරන මූලික හැකියා වර්ධනය කර ගනියි. | ස්වර ලිපි කියවීමේ ශිල්ප ක්‍රම | 01 |
| | නිපුණතාව 1.0 | ක්‍රියාකාරකම 12 | • ස්වර ප්‍රස්තාර කියවා ස්වර පුවරුව වාදනය කරයි.<br>• ප්‍රාසංගික ලෙස වාදනය කරයි.<br>• පාසලේ සියලු උත්සවයන්හි කැපී පෙනෙන කාර්යභාරයක් ඉටුකරන්නෙකු වෙයි.<br>• දිගු කාලීන ව සංගීතය හදාරන්නෙකුට වෘත්තීය අවශ්‍යතා සඳහා මග පාදයි. | ස්වර ලිපි බලා ස්වර පුවරුවෙන් වාදනය කරයි | 02 |
| | නිපුණතාව 1.0 | ක්‍රියාකාරකම 13 | • ස්වර ප්‍රස්තාර කියවා වාදනය කරයි.<br>• සියලු සංකේත නිවැරදි ව අවබෝධයෙන් වාදනය කරයි.<br>• තෝරාගත් භාණ්ඩය වැදනයෙන් තම දක්ෂතා මනාව ඉදිරිපත් කරයි.<br>• වාදනයෙහි නිපුණයෙකු විය හැකි ලක්‍ෂණ පෙන්වයි. | තෝරා ගත් භාණ්ඩයෙන් ස්වර ලිපි බලා වාදනය | 03 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | නිපුණතාව 3.0 | ක්‍රියාකාරකම 14 | • ග්‍රැමෆෝන් ගීයේ අනන්‍යතාව රකිමින් ගැයීමේ කුසලතාව ලබයි.<br>• ග්‍රැමෆෝන් ගීවල පසුබිම අවබෝධ කොට ගනියි.<br>• ග්‍රැමෆෝන් තැටියුගයට අයත් තොරතුරු වගුගත කරයි.<br>• එම ගීත සංරක්ෂණය කළ යුතු බව පිළිගනියි.<br>• ග්‍රැමෆෝන් ගී රස විඳිමින් අගය කරයි. | ග්‍රැමෆෝන් තැටි යුගයෙන් තෝරා ගත් ගීතයක | 01 |
| | නිපුණතාව 3.0 | ක්‍රියාකාරකම 15 | • මුල් කාලීන ගුවන් විදුලි සරල ගීයේ ලක්ෂණ පවසයි.<br>• තෝරා ගත් සරල ගී ඒවායේ අනන්‍ය ලක්‍ෂණ රකිමින් ගයා රසවිඳියි.<br>• ශ්‍රී ලංකාවේ සංගීත ක්ෂේත්‍රයට ගුවන් විදුලි සරල ගී මගින් සිදු වූ මෙහෙය අගය කරයි.<br>• ආනන්ද සමරකෝන් හා සුනිල් ශාන්ත යන යුග පුරුෂයින් දෙදෙනා පිළිබඳ තොරතුරු රැස් කරයි. | මුල් යුගයේ ගුවන් විදුලි සරල ගී නිර්මාණ අගයමු | 01 |
| | නිපුණතාව 3.0 | ක්‍රියාකාරකම 16 | • කපිරිඤ්ඤා ගීතවල ස්වභාවය විස්තර කරයි.<br>• කපිරිඤ්ඤා ගීතය නිවැරදි ව ගයයි.<br>• රිද්මයට අනුව චලනයෙහි යෙදෙමින් වින්දනාත්මක ව ගයයි.<br>• මෙම සම්ප්‍රදාය අනුව නිර්මාණය වී ඇති සරල ගීත ගයයි. | කපිරිඤ්ඤා ගීතවල ස්වභාවය | 01 |
| | නිපුණතාව 4.0 | ක්‍රියාකාරකම 19 | • සේ ගී යන්න නිර්වචනය කරයි.<br>• සමුද්‍රඝෝෂ විරිත යන්න නිර්වචනය කරයි.<br>• සාම්ප්‍රදායික නාදමාලාව ආරක්ෂා කර ගනිමින්, ගායනය කළ යුතු බව පිළිගනියි.<br>• සැළලිහිණි සංදේශයේ එන කවියක් සමුද්‍රඝෝෂ විරිතට අනුව ගායනය කරයි.<br>• වියත් බස හා ග්‍රාම්‍ය බසෙහි වෙනස සන්සන්දනාත්මක ව දකියි. | සේ ගීවල ස්වභාවය | 01 |
| | නිපුණතාව 4.0 | ක්‍රියාකාරකම 21 | • ගැමි ගී යන්න නිර්වචනය කරයි.<br>• ගැමි ගී නිර්මාණයට බලපෑ හේතු සාධක නම් කරයි.<br>• එම හේතු සාධක 3ට අදාළී වර්ග කරයි.<br>• ගැමි ගීවල සාම්ප්‍රදායික නාදමාලා අනුගමනය කරමින් ගායනා කරයි. | අපේ ජන ගී | 01 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | නිපුණතාව 4.0 | ක්‍රියාකාරකම 22 | • ආඝාතාත්මක ගී යන්න නිර්වචනය කරයි.<br>• ඇඳහිලි ගී යටතේ තුන්සරණේ ගීතයක් ගයයි.<br>• සමාජ ගී යටතේ කෙළි ගීතයක් ගයයි.<br>• තාල තබමින් ගීත ගයයි.<br>• නාදමාලාවට අනුව මෙම ගීත ගායනය කරයි.<br>• අනාගත පරපුර සඳහා මෙම ගීත සංරක්ෂණය කළ යුතු බව පිළිගනියි. | ආඝාතාත්මක බැති ගී හා කෙළි ගී | 01 |
| | නිපුණතාව 4.0 | ක්‍රියාකාරකම 23 | • අනාඝාතාත්මක ගී යන්න නිර්වචනය කරයි.<br>• මෙම ගීතවල ස්වභාවය හා සුවිශේෂ ලක්ෂණ විස්තර කරයි.<br>• මෙහෙගී වර්ග ගායනා කරයි.<br>• තාල තැබිය නොහැකි බැවින් මෙහි හැගීම් ප්‍රකාශනයට වඩාත් ඉඩකඩ ඇති බව පිළිගනියි.<br>• හෙළ සංස්කෘතික උරුමය රැක ගැනීමට පෙළඹෙයි. | අනාඝාතාත්මක ගීත ගයමු (ගැල්, පැල්, පාරු, පතල්) | 02 |
| | නිපුණතාවය 6.0 | ක්‍රියාකාරකම 25 | • නව නාට්‍ය සම්ප්‍රදාය හා නාට්‍ය ශෛලීන් වෙන් කර හඳුනා ගනියි.<br>• තෝරා ගත් නාට්‍යයන්හි නිෂ්පාදකවරු හා සංගීත අධ්‍යක්ෂකවරු පිළිබඳ තොරතුරු රැස් කරයි.<br>• සම්ප්‍රදායික නාඩගම් ගීතවලට වඩා නව නාට්‍ය ගීතයන්හි තනු හා සංගීතමය අංගයන්හි වෙනසක් ඇති බව අවබෝධ කර ගනියි.<br>• නව නාට්‍ය ගීත ගායනය / වාදනය කරයි. | නව නාට්‍ය ගී ගායනය | 01 |
| | නිපුණතාව 7.0 | ක්‍රියාකාරකම 26 | • තබ්ලාවේ දායාවෙන් (දකුණෙන්) උපදින අක්ෂර නම් කරයි.<br>• තබ්ලාවේ බායාවෙන් (වමෙන්) උපදින අක්ෂර නම් කරයි.<br>• දායාවේ සහ බායාවේ එකතුවෙන් උපදින අක්ෂර නම් කරයි.<br>• එක් එක් අවනද්ධාක්ෂර නිකුත්වන ස්ථාන වෙන් කොට දක්වයි.<br>• තබ්ලා වාදනයට පෙළඹවීමක් ඇති කර ගනියි. | හින්දුස්ථානි තාල පදවල අවනද්ධාක්‍ෂර | 01 |
| | නිපුණතාව 7.0 | ක්‍රියාකාරකම 27 | • තබ්ලාවේ අක්ෂර උපදින ස්ථාන හඳුනා ගනියි.<br>• තබ්ලාව මූලික අක්ෂර වයන ආකාරය පිළිබඳ ප්‍රායෝගික අත්දැකීම් ලබයි.<br>• තබ්ලාව වාදනයට පෙළඹෙයි. | හින්දුස්ථානී තාල පදවල අවනද්ධාක්ෂර තබ්ලාවෙන් වයන ආකාරය | 01 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | නිපුණතාව 9.0 | ක්‍රියාකාරකම 29 | • නාද සහ ශබ්ද අතර වෙනස දක්වයි.<br>• නාද සහ ශබ්ද විද්‍යාත්මක ව එකිනෙක සසඳයි.<br>• නාද උත්පාදනය වන අයුරු පැහැදිලි කරයි.<br>• සංඛ්‍යාතය, තරංගය, සම්පීඩනය, විරලනය වැනි පාරිභාෂික පද පැහැදිලි කරයි.<br>• වාතය තුළින් නාද තරංග ගමන් ගන්නා ආකාරය විස්තර කරයි.<br>• සංගීත ප්‍රසංගයක් ශාලාවක සහ එළිමහනක දී වඩාත් සාර්ථක ව ඉදිරිපත් කිරීමට අවශ්‍ය විද්‍යාත්මක කරුණු පිළිබඳ ව තර්ක කරයි. ප්‍රසංග වේදිකාවේ භාවිත කරුණු ලබන තාක්ෂණික උපකරණ (මයික්‍රොෆෝන්, ඇම්ප්ලිෆයර්, මික්සර් ආදී) පිළිබඳ අධ්‍යයනය කිරීමට පෙළඹෙයි. | නාද නිෂ්පත්තිය සහ ප්‍රගමනය | 02 |
| | නිපුණතාව 9.0 | ක්‍රියාකාරකම 30 | • නාදයේ ත්‍රිවිධ ගුණ නම් කරයි.<br>• භාරතීය සංගීත සිද්ධාන්තවල දී නාදයේ ත්‍රිවිධ ගුණ නම් කළ අයුරු දක්වයි.<br>• බටහිර සංගීතයට අනුව ඒවා නම් කරයි.<br>• නාදයේ ත්‍රිවිධ ගුණ එකිනෙක පැහැදිලි කරයි.<br>• එක් එක් කාරණයට බලපාන හේතු දක්වයි.<br>• එක් එක් ගුණය හා සම්බන්ධ විෂය කරුණු රූප සටහන් දක්වමින් පැහැදිලි කරයි. නාද ශ්‍රැති, ස්වර වශයෙන් පෙළ ගැසී ඇති බව පිළිගනියි. | නාදයේ ත්‍රිවිධ ගුණ | 01 |
| | නිපුණතාව 5.0 | ක්‍රියාකාරකම 33 | • ගීතයක ඇති නිර්මාණශීලී අගය වටහා ගනිමින් රස විඳියි.<br>• ගී පදමාලා සහ තනු නිර්මාණය කිරීමට පෙළඹෙයි.<br>• ගීත භාවපූර්ණව ගයයි. දෙමාපියන් කෙරෙහි ඇති ළබැඳියාව ප්‍රකාශ කරයි. | ගයා වයා විඳිමු මව්පිය ගුණ වරුණ ගී | 01 |
| | නිපුණතාව 8.0 | ක්‍රියාකාරකම 36 | • ශ්‍රවණය කළ ගායන වාදන කොටස් ජප් තාලය සහ දීප්චන්දි තාලය මත වෙන් කොට ගැනීමේ හැකියාව ලබයි.<br>• ශ්‍රවණ මාධ්‍යයෙන් ගී පද ප්‍රස්තාර කරයි.<br>• තාල පද අතර වෙනස්කම් වටහා ගනී.<br>• ජප්තාලය මාත්‍රා බෙදෙන අයුරු හඳුනා ගනියි.<br>• දීප්චන්දි තාලයේ මාත්‍රා බෙදෙන අයුරු හඳුනා ගනියි. | ජප්තාල්. දීප්චන්දි යන තාල මත නිර්මාණය වූ ගීත ප්‍රස්තාර කිරීම | 01 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | නිපුණතාව 8.0 | ක්‍රියාකාරකම 37 | • සමග්‍රහ සහිත ගී පද ප්‍රස්තාර කරයි.<br>• අවග්‍රහ සහිත ගී පද ප්‍රස්තාර කරයි.<br>• විෂමග්‍රහ සහිත ගී පද ප්‍රස්තාර කරයි.<br>විවිධ ග්‍රහයන් යෙදීම තුළින් ගීතයේ මාධූර්යය ඉස්මතු වන බව පිළිගනියි. | සමග්‍රහ විෂමග්‍රහ අවග්‍රහ සහිත ගී පද ප්‍රස්තාරකරණය | 01 |
| | **කලෙච්ඡේද එකතුව** | | | | **36** |